ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>මහ කොමසාරිස්තුමාගේ නැගෙනහිර පළාත් සංචාරය පළාත සමඟ ඉන්දියාවේ සුවිශේෂ සබඳතාවය අවධාරණය කරයි</u>

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා 2024 මැයි 1-4 දින දක්වා නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනම ආවරණය කරමින් නිල සංචාරයක නිරත විය. එතුමා නැගෙනහිර පළාත් ආණ්ඩුකාර සෙන්තිල් තොණ්ඩමාන් මහතා හමු වූ අතර පළාතේ දිස්ත්‍රික්ක තුන නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රැසක් සමඟ සාකච්ඡාවන්හි නිරත විය. මෙයට අමතරව එතුමා පළාතේ ජනතාව වෙනුවෙන් ඉන්දීය රජය විසින් ක්‍රියාත්මක කරන විවිධ ව්‍යාපෘතීන් හි ප්‍රගතිය නිරීක්ෂණය කළ අතර ඓතිහාසික, සංස්කෘතික සහ වාණිජ වැදගත්කමකින් යුත් ස්ථාන රාශියක සංචාරය කළේය.

2. අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල පැවති නියැළීම්වලදී මහ කොමසාරිස්තුමා අවධාරණය කළේ නැගෙනහිර පළාතට ඉන්දියා - ශ්‍රී ලංකා ද්විපාර්ශවික හවුල්කාරීත්වය තුළ සුවිශේෂී වැදගත්කමක් හිමි වන බවයි. සමස්ත පළාතම ආවරණය කරමින් විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාත්මක ව්‍යාපෘතීන් 33කින් සමන්විත බහු ආංශික ප්‍රදාන පැකේජය මෙන්ම ත්‍රිකුණාමලය පුළුල් ලෙස සංවර්ධනය කිරීම උදෙසා දෙරටෙහි රජයන් දෙක අතර පවතින සාකච්ඡා පිළිබඳව ද එතුමා මෙහිදී සඳහන් කළේය. නැගෙනහිර පළාතට සැලකිය යුතු ප්‍රතිලාභ ගෙන එමින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ක්‍රියාත්මක විවිධ සම්බන්ධකතා සහ බලශක්ති ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ද මහ කොමසාරිස්තුමා අදහස් දැක්වීය.

3. මහ කොමසාරිස්තුමා ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ මඩකලපුව ශික්ෂණ රෝහලේ ඉදිකරන ශල්‍ය ඒකකයේ ඉදිකිරීම් කටයුතුවල

ප්‍රගතිය සොයා බැලුවේය. මෙම ශල්‍ය ඒකකයේ වැඩ කටයුතු කඩිනමින් අවසන් කිරීමට නියමිතය. එතුමා මඩකලපුව සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ක්‍රියාත්මක ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතීන්වල ද සංචාරයක නිරත විය. මෙම ව්‍යාපෘතීන් අඩු ආදායම්ලාභී සහ නිවාස රහිත ජනතාව උදෙසා ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරමින් නිවාස 600ක් ඉදිකරන ව්‍යාපෘතියක කොටසක් වේ.

4. එසේම, මහ කොමසාරිස්තුමා දඹුල්ල ප්‍රදේශයේ මෙට්‍රික් ටොන් 5000ක උෂ්ණත්වය පාලිත ගබඩාවේ වැඩ කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා සක්‍රීය ලෙස කටයුතු කරන ලෙස අදාළ පාර්ශවකරුවන් දිරිගැන්වීය. ශ්‍රී ලංකාවේ මෙවන් ආකාරයේ පළමු ගබඩාව වන මෙම ගබඩාව ප්‍රදේශයේ ගොවි ජනතාවට පසු අස්වනු හානිය සැලකිය යුතු ලෙස අවම කරගැනීම සඳහා උපකාරී වනු ඇත. සාම්පූර් සූර්ය බලාගාරය සඳහා යෝජිත භූමිය වෙත සංචාරය කළ එතුමා එහි වැඩ කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කෙරෙනු ඇතැයි විශ්වාසය පළ කළේය.

5. මහ කොමසාරිස්තුමා ලංකා ඉන්දීය තෙල් සමාගමේ (LIOC) විවිධ නිෂ්පාදනාගාර නැරඹීමට ද එක් විය. මෙම නියැළීම්වලදී එතුමා 2022 වසරේදී ශ්‍රී ලංකාව මුහුණ දුන් බලශක්ති අර්බුදයේ අහිතකර බලපෑම් අවම කිරීමෙහි ලා සමාගම විසින් ඉටු කළ අසමසම කාර්යභාරය සිහිපත් කළේය. මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ත්‍රිකුණාමලය නව ඉන්ධන පිරවුම්හල ද විවෘත කෙළ්ය. එසේම එතුමා අම්පාර ඔලුවිල් වරායේ ද සංචාරයක නිරත වූ අතර එහිදී එතුමා වරායේ අවසාදිත තැන්පතු හේතුවෙන් දේශීය ප්‍රජාව මුහුණදෙන අභියෝග පිළිබඳව ද දැනුවත් කරන ලදී.

6. මහ කොමසාරිස්තුමා ත්‍රිකුණාමලය ගුවන් හමුදා කඳවුරේ ද සංචාරයක නිරත විය.එතුමා ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන්ට අමතරව ඩෝනියර් ගුවන්යානයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා හමුදා නිලධාරීන්ට පුහුණුව ලබා දීම සඳහා මෙහි රැඳී සිටින ඉන්දීය නාවික හමුදා ප්‍රවීණයන් සමඟ ද පිළිසඳරක නිරත විය. එම ගුවන්

යානය ශ්‍රී ලංකාවේ ආවේක්ෂණ හැකියාවන් ඉහළ නැංවීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

7. මහ කොමසාරිස්තුමා කාත්තන්කුඩිහි මොහිදීන් මෙත්තායි ග්‍රෑන්ඩ් ජුම්මා දේවස්ථානය සහ බාදුර්යා ජුම්මා දේවස්ථානය වන්දනා කළේය. ඓතිහාසික සේරුවිල මංගල රජමහා විහාරය ද වැඳ පුද ගත් එතුමා ත්‍රිකුණාමලය පෞරාණික තිරුකෝනේෂ්වරම් කොවිලේදී ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞභාග්‍යය සහ සාමය උදෙසා ප්‍රාර්ථනා කළේය. මහ කොමසාරිස්තුමා මඩකලපුව ගාන්ධි උද්‍යානයේ පිහිටා ඇති මහත්මා ගාන්ධි පිළිරුවට ද පුෂ්පෝපහාර දැක්වීය.

8. මහ කොමසාරිස්තුමා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ අඩු අදයම්ලාභී පවුල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නව මූල්‍යාධාර යෝජනා ක්‍රමයක් සමාරම්භ කළේය. මෙවන් යෝජනා ක්‍රමයක් 2023 දෙසැම්බර් මාසයේදී යාපනය විශ්ව විද්‍යාලය සඳහා ද හඳුන්වා දෙන ලදී. මහ කොමසාරිස්තුමා පළාතේ ප්‍රදේශ දෙකක ජනතාව සඳහා වියළි සලාක ද බෙදා දුන්නේය. එතුමා LIOC සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා මූලික සමාජ සේවා මුලපිරීම් දෙකක් සදහා ද සහභාගී විය.

9. නැගෙනහිර පළාතට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සම්බන්ධකතා මුලපිරීම්වල ප්‍රමුඛස්ථානයක් හිමිවන අතර ඉන්දියාව මේ සම්බන්ධයෙන් අදාළ ශ්‍රී ලංකා නිලධාරීන් සමඟ කැපවී වැඩ කිරීමට සූදනමින් සිටින බව මහ කොමසාරිස්තුමා සඳහන් කළේය. දෙරට අතර සම්බන්ධකතාවයේ වැදගත්කම අවධාරණය කරමින් මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේ නාගපට්ටිනම් සහ යාපනය අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවා 2024 මැයි 13 වන දින සිට යළි ආරම්භ වීමට නියමිත බවයි.

***

කොළඹ

2024 මැයි 05